# බළන්ගොඩ නගර සභාව

## 2019-02-12 වන දිනැති මහා සභාවේ රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.02.12**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම**

2019-02-12 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්, 2019.01.08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් 2019.01.08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙම වාර්තාවන්හි සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විසින් විමසා සිටි අවස්ථාවේදි , පිළිතුරු ලබාදුන් ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් 2019.01.08 දිනැති සභා වාර්තවේ ගරු සභාපතිතුමන් විසින් කරන ලද අවසන් කථාව යටතේ නගර සභාවේ පුරප්පාඩු රැකියා තනතුරු සඳහා බඳවාගැනීමට සභාවේ යෝජනා සම්මත කරගත්තද එයත් පළාත් සභාව වෙත ගොස් කණ්ඩායමක් විසින් කඩා කප්පල් කර දැමූ බව පවසා ඇති මුත්, තමන් විසින් පවසා සිටින ලද්දේ, පුරප්පාඩු රැකියා තනතුරු සඳහා බඳවාගැනීමේදි සාධාරණ අයුරින් සභාව නියෝජනය කරනු ලබන සියළු පක්ෂ සඳහා එම තනතුරු බෙදී යන අයුරින් බඳවා ගන්නා ලෙසත් පුරප්පාඩු ගැසට් කල යුතුයි යන්න බවත් මෙහිදී පවසා සිටින ලදී.
එමෙන්ම සභාවේ දෙවරක් සම්මත කර ගන්නා ලද යෝජනාවකට අනුව ඉදිකරන ලද නව ගොඩනැගිලි පරිශ්‍රය පෙත්සම් ගසා කරන ලද කඩා කප්පල්කාරී ක්‍රියාවක් නිසා අතරමග නතර කිරීමට සිදු වූ බව පවසා ඇති අතර තමන් විසින් දන්වා සිටින ලද්දේ ඉදිකිරීම නීත්‍යානුකුල නොවන බව පමනක් බවත් මෙහිදී පවසා සිටින ලදී.
මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් සභාවේ අනුමැතිය සමඟ බඳවා ගැනීම් සිදුකලද මන්ත්‍රි කණ්ඩායමක් විසින්, ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය වෙත ගොස් සභා අනුමැතියකින් තොරව මෙම බඳවාගැනීම් සිදුකල ඇති බවට පවසා එම කටයුතු නතර කර දැමූ බවට ආණ්ඩුකාර කාර්යාලයෙන් දැනගැනීමට ලැබුන අතර,මන්ත්‍රි පහසුකම් සැපයීමට නොහැකි නිසා එම පහසුකම් සැපයිමේ අටියෙන්, සභාවේ අනුමත ඉදිකිරීම් ආරම්භ කලද පෙත්සම් යැවීම නිසා බාධාකාරී වූ බැවින් ඉදිකිරීම් නතර කර දැමීමට සිදු වූ බව පවසා සිටින ලදී.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

● ගරු සභාපතිතුමන් විසින් සිය නිවේදන ආරම්භ කරමින්, රුපියල් ලක්ෂ 120 ක් වටිනා ගළි බවුසරයක් ලබාදීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමන්ටත්,ගරු අග්‍රාමාත්‍යතුමන්ටත්, හිටපු ගරු අමාත්‍ය ෆයිසර් මුස්තාෆා මැතිතුමන්ටත්, ගරුඅමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමන්ටත්, එ.ජා.ප. ප්‍රධාන සංවිධායිකා ගරු අමාත්‍ය තළතා අතුකෝරාළ මැතිනියටත්, ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාවක් කරගන්නා බව පවසා සිටිනා ලදී.

● සභාවේ කටයුතු මහජනයා වෙත වඩාත් ගුණාත්මක අයුරින් ලබාදීමේ අපේක්ෂාවෙන් පත්කරන ලද කමිටු සියල්ල ක්‍රියාකාරී අයුරින් පවත්වා ගෙන යාම සඳහා බලාපොරොත්තු වන බැවින්, සභාවේ බල ප්‍රදේශය තුළ ජීවත්වන ප්‍රජාව වෙත ගුණාත්මක සේවයක් ලබාදීම සඳහා සභාවේ සියළුම දෙනා තම සහයෝගය දෙන ලෙස මෙහිදී දැනුවත් කරන ලදී.

● බලංගොඩ නගරය තුළ මත්ද්‍රව්‍යය උවදුර ශීඝ්‍රයෙන් පැතිරෙන බවට කරුණු සැලවී ඇති අතර, බලංගොඩ ප්‍රදේශයේ ජීවත්වන දරුවන්ගේ අනාගතය වෙනුවෙන්, මෙම දුරාචාරයන් නැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සභාව මැදිහත්වීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන මෙන් මෙහිදී ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

● ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අසනීප බව පවසා සභාවට සහභාගී විය නොහැකි බවට ලිපියක් එවා ඇති බවත් එතුමාගේ නිවාඩු අනුමත කරන බවත් ගරු සභාපතිතුමන් විසින් සභාව දැනුවත් කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා /ටෙන්ඩර්/මිල ගණන් විවෘත කිරීම ඉදිරිපත් කිරීම**

03:01 ඕළුගංතොට කොට්ඨාශයේ ඕළුගංතොට මූලික රෝහල ඉදිරිපිට ව්‍යාපාර කටයුතු කරමින්,ජීවනෝපාය මාර්ගය සකසා ගත්, ප්‍රදේශවාසීන්ට එම ජීවනෝපාය මාර්ග අවහිර වීමෙන් සිදු වූ අසාධාරණය පිළිබඳ සාකච්ඡා කිරීම. **ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් කල් දී ඇති ප්‍රශ්න යටතේ ඕළුගංතොට කොට්ඨාශයේ ඕළුගංතොට මූලික රෝහල ඉදිරිපිට ව්‍යාපාර කටයුතු කරමින්,ජීවනෝපාය මාර්ගය

සකසා ගත්, ප්‍රදේශවාසීන්ට එම ජීවනෝපාය මාර්ග අවහිර වීමෙන් සිදු වූ අසාධාරණය පිළිබද සාකච්ඡා කිරීම පිළිබඳව ගරු සභාපතිතුමන් විසින් සභාවට යොමු කල අවස්ථාවේ,

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් අදහස් දක්වමින් ඉතා දීර්ඝ කාලයක සිට වෙළෙඳාමේ නිරත වෙන ලද පදික වෙළෙඳුන් 32 ක් පමණ මෙහි ව්‍යාපාර කටයුතුවල නිරතවූ බවත් ඔවුන් මේවන විට සිය දිවි නසා ගැනීමේ තත්වයට පත්ව ඇති හෙයින්, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සකච්ඡා කොට සභාවෙන් දෙනු ලබන සැළැස්මකට අනුව නැවත මෙම කඩ ස්ථාපිත කර ගැනීම සඳහා ඉඩ කඩ ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් මාර්ග සංවර්ධන අධිකාරිය සමබන්ධ වී මෙම කටයුතු සිදු කල අතර,රෝහලේ කාණු අවහිර වී පීඩා ඇතිවන බවටත්,චර්ම රෝග සායනය නවත්වන බවටත් රෝහලින් දන්වා එවා ඇති බව පවසා සිටින ලදී.මෙම ස්ථානයේ බොහොමයක් දෙනා නගර සීමාවෙන් පිටත පදිංචි කරුවන් වන අතර, කඩ ඉදිකර කුළියට දීමෙන් ආදායම් රැස්කර ඇති බවට දැනගන්නට ලැබුන බවත් පවසා සිටින ලදී. ඉදිරියේදි කිරිහල පවතින ස්ථානයේ සිට ගඟ දෙසට අමානෝ ෂීට් යොදා කඩ පේළියක් ඉදිකිරීමට බලාපොරොත්තු වන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින් කිරිහළද අනවසර බව පවසා සිටි අතර වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලපත්ති මැතිතුමන් විසින් කඩපේළිය නිසා රෝහළ අපවිත්‍ර වන බව පැවසූ නමුත්, බාහිර රෝගී අංශයේ කාණුව එම ස්ථානයෙන් පවතින බවත්,අහිංසක වෙළෙඳුන් ඒ වෙනුවෙන් හසුවූ බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් අදහස් දක්වමින් තමන් නියෝජනය කරන ගමේ සිද්ධියක් වන අතර මෙමගින් අහිංසක වෙළෙඳුන් කිහිප දෙනෙක් හට සිදු වූ මහත් අසාධාරණය නිසා සභාව මැදිහත් වී මේ සම්බන්ධව ක්‍රියාත්මක වන ලෙස පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර කඩා ඉවත් කරන ලද කඩ පේලිය සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා සාකච්ඡාවක් කැඳවීම සඳහා කටයුතු සිදු කරන බව පවසා සිටින ලදී.මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**ටෙන්ඩර්/මිල ගණන් විවෘත කිරීම ඉදිරිපත් කිරීම**

- පොදු වෙළඳසැල අංක 07 ක කාමරය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම
- 2019 වර්ෂය සදහා ගල් වැලි අයිතම මිලදී ගැනිම සදහා කැදවන ලබු මිල ගණන් අනුව තෝරාගත් මිලගණන් හා සැපයුම්කරුවන් පිළිබද තොරතුරු ඉදිරිපත් කිරීම

ටෙන්ඩර් පත් විවෘත කිරීම හා සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදී. ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු සභාවක් බවට පත්කරන ලදී.
ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් ටෙන්ඩර් මණ්ඩල තීරණ පිළිබඳව ගරු සභාවේ සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී

**03:02 ● පොදු වෙළඳසැල අංක 07 ක කාමරය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීම.**

පොදු වෙළඳ සැල අංක 07 දරණ කඩ කාමරය සඳහා එක් ලංසු පතක් නිකුත් වී තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි ඇල්ලෙපොළ හීන් වඩුගේ උදාර ඉදුනිල් මහතා එහි ලංසු මුදල ලෙස රු. 4,800.00 ක මුදලක් දක්වා තිබූ අතර එම ලංසුව පිළිගැනිමට ටෙන්ඩර් කමිටුව විසින් ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක කිරීමට සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**03:03 ● 2019 වර්ෂය සදහා ගල් වැලි අයිතම මිලදී ගැනිම සදහා කැදවන ලබු මිල ගණන් අනුව තෝරාගත් මිලගණන් හා සැපයුම්කරුවන් පිළිබද තොරතුරු.**

⋆කලුගල් 6''× 9 '' - 3400.00

⋆කලුගල් 4''- 4800.00

⋆කලුගල්3 '' - 5400.00

⋆කලුගල් 2'' - 5400.00

⋆කලුගල් 6''× 9 '' - 3400.00

⋆ක්‍රෂර් කළුගල් 3/4 '' - 5400.00

★චිප්ස් 1/4 -4700.00

★ගල්කුඩු -4800.00

★ගංගා වැලි -11350.00

★බ්ලොක් ගල් 14×4×6 (කි) 15 1/2× 7 1/2 ×4 - 42.00

★අන්තර් බන්ධන කොන්ක්‍රිට් ගල් (N-40) - 44.00

★අන්තර් බන්ධන කොන්ක්‍රිට් ගල් (N-25) - 35.00

★අළු හුණු 25 කිලෝ -300.00

★1''-4× 0 ''-8''× 0-4 '' පුරවපු ගල් -42.00

★ 1''-4× 0 ''-8''× 0-6 '' පුරවපු ගල් -45.00

**සඳහා අවම මිල ගණන් ඉදිරිපත්කරන ලද තිරණ සප්ලයර් වෙතින් මිලදී ගැනීමටත්,**

★ කලුගල් 1/2 -4900.00

★කලුගල් 1 - 5000.00

★ක්‍රෂර් කලුගල් 3/4 '' - 5400.00

★කලුගල් 1/2 -4500.00

★ABC මිශ්‍රණය -5000.00

**සඳහා අවම මිල ගණන් ඉදිරිපත්කරන ලද** එච්.සී.ඩී. වසන්ත කුමාර වෙතින් මිලදී ගැනිමටත්

★ගඩොල් :9"x4 1/2 ½ 2 1/4" -11.00 B.M.U.කන්ස්ට්‍රක්ෂන් වෙතින් මිලදී ගැනිමටත්

★සිමෙන්ති කම්බි යකඩ අයිතම නිරන්තර මිල වෙනස්වීම් භාජනය වන බැවින් සිමෙන්ති කම්බි ඇණ යකඩ අයිතම පවතින වෙළඳපොළ මිල ගණන් අනුව රජයේ ප්‍රමිතියට අනුකූලව මිලදී ගැනිමටත් ටෙන්ඩර් කමිටුව තිරණය කරන ලදී.

04. කල් දී ඇති ප්‍රශ්න

**ගරු නාගරික මන්ත්‍රි කේ.පී.ජේමදාස මැතිතුමා**

04:01 බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීදි කිහිපයකම ස්ථානගත කර තිබූ වීදි පහන් කිහිපයක් විදුලි මණ්ඩලය විසින් ඉවත්කර ගොස් ඇත. මේ සම්බන්ධව ඔබතුමා දනුවත්ද? එසේ දනුවත් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද ?

**ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා විසින් අසන ලද** බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීදි කිහිපයකම ස්ථානගත කර තිබූ වීදි පහන් කිහිපයක් විදුලි මණ්ඩලය විසින් ඉවත්කර ගොස් ඇත. මේ සම්බන්ධව ඔබතුමා දැනුවත්ද? එසේ දැනුවත් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන ගැටළුවට පිළිතුරු දීම සඳහා හා මෙම වීදි පහන් සම්බන්ධයෙන් සභාවේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් විදුලි බල මණ්ඩලයේ නිළධාරීන් කැඳවා තිබුණි.

මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලද අතර එම දැනුවත් කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී.

04:02 බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලේ සිවිලිම නවීකරණ කටයුතු සඳහා ඉවත්කර බොහෝ කාලයක් ගතවී ඇතිමුත් මේතාක් එය යථා තත්වයට පත්කර නැත්තේ මන්ද පැහැදිලි කරන්න.

මේ සඳහා පිලිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මෙහි කටයුතු මේවන විටත් ආරම්භ කර ඇති බවත් ඉදිකිරීම් ද්‍රව්‍යය මිලට ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇති බවත්, පවසා සිටින ලදී.

04:03 නගර සභා බල ප්‍රදේශය තුළ අයාලේ සැරිසරන ගවයින් හා සුනඛයින් සම්බන්ධයෙන් අවස්ථා කීපයකදීම මා ඇතුළු කීපදෙනෙකු විසින් ඔබතුමා දැනුවත් කර ඇතත් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට නොහැකි වූයේ ඇයි?
මේ සම්බන්ධව පශු වෛද්‍ය කාර්යාලය හා ජලභීතිකා වෛද්‍යවරිය දැනුවත් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය කමිටුවට යොමු කිරීමෙන් අනතුරුව ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

04:04 නගර සභාව සතු මාර්ග කීපයක් "පනානේ ශ්‍රී සංඝබෝධි" නාහිමි හිටපු අමාත්‍ය "ඇම්.ඇල්.ඇම්.අබුසාලි" මහතා හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.එච්.පූජ්‍යදාස මහතා යන අයගේ නමින් නම්කරන ලෙස පිළිවෙලින් කේ.පී.පේමදාස මහතා එය ජුනයිදීන් මාලික්ෂා මහතා සහ

ඩබ්.ඒ.නදීශාන් ජයසේන මහතා යන ගරු සභිකයින් විසින් සභාවට යෝජනා ඉදිරිපත්කර සම්මත වී ඇතත් එය ඉටුකිරීම ප්‍රමාද වී ඇත.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් විරෝධතා කැදවා අවසන් බවත්, ගරු අධිකරණ ආමාත්‍යය තළතා අතුකෝරාළ මැතිතුමිය ලිපියක් මගින් දැනුවත් කර ඇති බවත් ඒ හා සම්බන්ධ වී ඉදිරි කටයුතු ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මන්ත්‍රීතුමා සම්බන්ධ වී සිදු කරන බවත් පවසා සිටින ලදී.

**05. කල් දී ඇති යෝජනා**

**05:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**05:01:01 පෙර පාසල් ගුරුවරුන්ගේ දීමනාව රු.10,000 සිට රු.15,000 දක්වා වැඩි කිරීම.**

පෙර පාසල් ගුරුවරුන්ගේ දීමනාව රු.10,000.00 සිට රු.15,000.00 දක්වා වැඩි කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සමඟ 2019 වසරේ ජනවාරි සිට මෙය ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:02 බලංගොඩ නගර සභා පෙර පාසල් ගුරු පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා තීරණයක් ගැනීම.**

බලංගොඩ නගර සභා පෙර පාසල් ගුරු පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා තීරණයක් ගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමන් විසින් සුදුසුකම් සහිත නිළධාරින් දෙදෙනෙකු මෙම පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කර සිටි අතර ගරු

ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින්ද එම යෝජනාව සනාථ කරමින් නියමිත සුදුසුකම් සපුරාලන ලද්දන් බඳවා ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින්, පුරප්පාඩු ගැසට් කර,නගර සභා සීමාව තුළ සිටින අපේක්ෂයන් හට ප්‍රමුඛතාවය ලබාදී බඳවා ගැනීම් සිදු කරන ලෙස පවසා සිටින ලදී.
විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ03 වරිපනම් බදු නිදහස් කිරීම. (ආරියදාස නානායක්කාර,අක්කර 18)**

අක්කර 18,බලංගොඩ ලිපිනයේ පදිංචි ආරියදාස නානායක්කාර මහතා හට ආර්ථික අපහසුතා ඇති බව පවසා වරිපනම් බදු නිදහස් කරන මෙන් සභාවට ඉදිරිපත් කල තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එහිදී අඩු ආදායම්ලාභීන් බවට ග්‍රාම නිළධාරි විසින් නිර්දේශය ලබාදී ඇති බවත් වරිපනම් නිදහස් කිරීම සුදුසු බවත් ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ04 ආයතනවලින් මුදල් ඉල්ලා ව්‍යාජ දුරකථන ඇමතුම් ලබාදීම සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම. (ම.සෞ.ප.)**

පරිසර බලපත්‍රය ලබාදෙන බවට ආයතනවලින් මුදල් ඉල්ලා ව්‍යාජ දුරකථන ඇමතුම් ලබාදීම සම්බන්ධව පැමිණිලි ලැබී ඇති බවත් සභාවේ නම හා නිළධාරීන්ගේ නම් භාවිතා කර සිදුකරන මෙම අයථා ක්‍රමවේද පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් යොමුකර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මෙම තත්වය වැළැක්වීම සඳහා සහකාර පොලිස් අධිකාරී දැනුවත් කර විශේෂ විමර්ශනයක් කිරීම සුදුසු බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් අදහස් දක්වමින් සභාවේ නිළධාරීන් ආයතන වෙත යවා මුදල් එකතුකිරීම සිදු නොකර , බලපත්‍ර ලබාගැනිම සඳහා සභාවට පැමිණ මුදල් ගෙවා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස්කිරීම තුළින් මෙවන් තත්වයන් වළක්වාගත හැකි බව පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:05 සුළු මුදල් අග්‍රිමය රු.25,000 දක්වා වැඩි කිරීම**

දැනට පවතින සුළු මුදල් අග්‍රිමය රු.5000.00 මුදල ප්‍රමාණවත් නොවන බැවින් , එම මුදල රු.25,000.00 තෙක් වැඩිකර දෙන මෙන් ඉල්ලා ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:06 දේශපාලන හේතු නිසා විවිධ ගැටළුවලට මුහුන දුන් අයට සහන සැලසීම. ●පී.ටී.ඒ.ස්වර්ණලතා ● ඩබ්.ඒ.ඒ.විජේසිංහ**

දේශපාලන හේතු නිසා විවිධ ගැටළුවලට මුහුන දුන් අයට සහන සැලසීම සඳහා පා.පා.කො. අංක CLG/LG/3/11/11 හා 2018.10.13 දිනැති ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳ ගරු සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාවේ ඒකමතික අදහස වූයේ මෙම සිදුවීම් දේශපාලන පළිගැනීමක් බවට පිළිගත නොහැකි බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවයි. මෙහිදී ගරු සභාපතිතුමන් විසින් සභාවේ ඉදිරිපත් වූ අදහස්

අනුව පී.ටී.ඒ.ස්වර්ණලතා මහත්මිය හා ඩබ්.ඒ.ඒ.විජේසිංහ මහතා විසින් කරන ලද ඉල්ලීම ට අනුව දේශපාලන හේතු නිසා විවිධ ගැටළුවලට මුහුන දුන් අයට සහන සැලසීමේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ07 ඖෂධ සංයෝජක පුහුණුව සම්බන්ධව පුහුණුව ලබාදීම. දිල්කි තාරකා ජයවික්‍රම**

ආයුර්වේදයේ පුරප්පාඩුව පවතින ඖෂධ සංයෝජක තනතුර සඳහා සේවා අවශ්‍යතාව මත දිගු කාලයක සිට සේවයේ යොදවා සිටින දිල්කි තාරකා ජයවික්‍රම මහත්මිය සඳහා එම සේවයේ නිරත වීමට අවශ්‍ය පුහුණුව ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ08 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ09 නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වෛද්‍යවරිය නිවාඩු ගිය පසු වැඩ ආවරණය කිරීම සඳහා වෙනත් වෛද්‍යවරයෙකුගේ සේවය ලබාගැනීම**

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ එක් වෛද්‍යවරියක පමණක් සේවයෙහි නියුතු බැවින් ඇය නිවාඩු ගිය පසු වැඩ ආවරණය කිරීම සඳහා වෙනත් වෛද්‍යවරයෙකුගේ සේවය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන

ලදී.මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මේ පිළිබඳව පළාත් සභාව දැනුවත් කර ලිපියක් සකස්කර වෛද්‍යවරියගේ නිවාඩු දින ආවරණය සඳහා වෙනත් වෛද්‍යවරයකුගේ සේවය ලබාදීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙන ලෙසට ඉල්ලා සිටීම සුදුසු බවට තීරණය කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ10 බුළත්ගම තළාවූ පාර අංක 245/11 හි පර්චස් 6.41 ක බිම් ප්‍රමාණය සම්බන්ධ නීතිඥ උපදෙස් සභාවට ඉදිරිපත් කිරීම**

බුළත්ගම තළාවූ පාර අංක 245/11 හි පර්චස් 6.41 ක බිම් ප්‍රමාණය සම්බන්ධ නීතිඥ උපදෙස් සභාවට ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී මෙම ඉඩම් කොටස සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පැවතෙන බැවින්, නීතිඥ උපදෙස් අනුව නඩුව අවසන් වන තෙක් ඒ සම්බන්ධව සභාවේ සාකච්ඡා නොකිරීම සුදුසු බවට කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ11 ත්‍රී විලරය සඳහා ඉන්ධන ලබාගැනීම ඒ.එන්.ජයසිංහ**

කොම්පෝස්ට් ව්‍යාපෘතියේ වැඩ පරීක්ෂක ලෙස සේවයෙ යෙදෙන **ඒ.එන්.ජයසිංහ මහතා** තම රාජකාරි සඳහා දෛනිකව බැංකියවත්තට යාමට ඒමට සිදුවන බවත්,සභාව මගින් ලබා දෙන ලද යතුරු පැදිය සභාවේ අවශ්‍යතාවය මත නැවත ලබාගත් හෙයින් ඔහුගේ පුද්ගලික ත්‍රී විලරය සඳහා ඉන්ධන ලබාදෙන මෙන් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා මාසිකව ලීටර් 15 ක ඉන්ධන ලබාදීමට සුදුසු බවට කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ12 ඉරෝ විත් ඇරෝ කලර් නයිට් සංගීත ප්‍රසංගය සඳහා නගර සභා ක්‍රීඩාංගණය වෙන් කරවා ගැනීම.**

ඉරෝ විත් ඇරෝ කලර් නයිට් සංගීත ප්‍රසංගය සඳහා නගර සභා ක්‍රීඩාංගණය වෙන් කරවා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාවේ පළ කරන ලද සියළු අදහස් සලකා බලා ගරු සහපතිතුමන් විසින් කොට්ඨාශ ක්‍රීඩා අවසන් වූ පසු අප්‍රේල් මස ක්‍රීඩා පිටිය ලබාදීමට හා නගර සභාව වෙත ආපසු ගෙවන රැදවුම් මුදලක් ලබාගෙන ,සභාව විසින් පනවනු ලබන කොන්දේසි සඳහා එකඟත්වය ලබාගත් පසුව ලබාදීම සුදුසු බවට ගෙනා යොජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ13 2018 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව පත් කිරීමට සහා අනුමැතිය ගැනීම

- එස්.එච්.ඒ. කරුණාරත්න මිය - ලේකම්
- එම්.ඩී.එස්.ප්‍රනාන්දු මයා - ගණකාධිකාරී
- ඩබ්.එම්.ගාමිණි වීරසිංහ මයා - ප්‍රජා සංවර්ධන නිළධාරී
- ජේ.සී.එම්.විජේපාල මයා - විමර්ශන නිළධාරී
- ජී.ඩී.ඒ.සේමපාල මිය - කළමනාකරණ සහකාර
- එස්.එච්.කේ.කරුණාරත්න මයා - කාර්මික නිළධාරී
- එස්.එම්.සී.එස්.කේ.අබේසිරිවර්ධන මයා - කාර්මික නිළධාරී

- ඒ.රජිත කොස්වත්ත මයා - සංවර්ධන නිළධාරී
- ටී.ජී.කේශනී ප්‍රසාදිකා මිය - සංවර්ධන නිළධාරී
- එම්.ආර්.එම්.රසිකා සෙව්වන්දි මිය - සංවර්ධන නිළධාරී
- එම්.සෙල්වරාණි මිය - කළමනාකරණ සහකාර
- ජේ.එම්.ජී.ඩී.ජයසුන්දර මිය - කළමනාකරණ සහකාර
- ඊ.එම්.චිත්‍රා නිශාන්ති මිය - කළමනාකරණ සහකාර
- මල්කාන්ති උඩවත්ත මිය - පුස්තකාලයාධිපති

2018 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව පත් කිරීමට සහා අනුමැතිය ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් 2018 භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටුව සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා,ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා වීරසිංහ මැතිතුමිය,ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන්ගේ නම් එකතු කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ14 කොම්පෝස්ට් හලන යන්ත්‍රය අළුත්වැඩියා කිරීම.**

කොම්පෝස්ට් හලන යන්ත්‍රය කාර්යක්ෂමතාව වැඩිවන පරිදි හා අපතේ යාම් අඩුවන පරිදි අළුත්වැඩියා කිරීම සිදු කල යුතු බවත් ඒ සඳහා රු.680,000.00 පමණ වැය වන බවට ගණන් බලා ඇති බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05း01း15 බැංකියවත්ත නඩු සමථයකට පත්කර ගැනීම සම්බන්ධව තීරණයක් ගැනීම.**

බැංකියවත්ත නඩු සමථයකට පත්කර ගැනීම සම්බන්ධව තීරණයක් ගැනීම සම්බන්ධ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් බැංකියවත්ත නාය යාමේ සිද්ධිය හේතුවෙන් අගතියට පත් ජනතාව කෙරෙහි සාධාරණයක් ඉටුකරන ලෙස පවසා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් අදහස් දක්වමින් සභාවේ සියළු සභිකයන් සහයෝගයෙන් එක මතයක සිට මෙම නඩු සමථයකට පත්කර ගැනීම සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

සභාවේ සාකච්ඡා කරන ලද කරුණු සලකා බලා ගරු සභාපතිතුමන් විසින් මෙම නඩු සමථයකට පත් කර ගැනීමේ කොන්දේසි පිළිබඳව එකඟතාවයකට පත්ව යම් ගැටළුවක් පැන නැගුනහොත් සභාව විසින් කළමණාකරණය කර ගැනීමේ අරමුණින් ,බැංකියවත්ත ජනතාවට සිදුවන පීඩාව පිළිබඳව කරුණු සලකා බලා මෙම නඩු සමථ කර ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05း01း16 අනුමත සැලසුම් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති ඉදිකිරීම් සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නගර සභාව වෙත ලැබී ඇති පිටපත් ලිපි සම්බන්ධයෙන් තීරණයක් ගැනීම.**

අනුමත සැලසුම් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති ඉදිකිරීම් සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නගර සභාව වෙත ලැබී ඇති පිටපත් ලිපි සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සම්බන්ධ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමන් විසින් නගරයේ ව්‍යාපාරිකයන්ට සිදුවන පීඩාව අවම කරමින් ඔවුන් ආරක්ශා කිරීම පිදිබඳ ක්‍රියා මාර්ගයක් ගත යුත බවත්, සභාපතිතුමන්ගේ බලය පාවිච්චි කරමින් ව්‍යාපාරිකයන් රැක ගැනීම සඳහා කටයුතු කරන

ලෙසත්,මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් කැඳවීම සුදුසු බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් අදහස් දක්වමින් නගරයේ බොහෝ ගොඩනැගිලි ඉතා පැරණි මෙන්ම වරිච්චි බිත්තිවලින් යුක්ත බැවින්, ඒ සඳහා සැලසුම් ඉල්ලීම අසාධාරණ බවත්,මේ සඳහා ගරු සභාවේ මැදිහත් වීම ඉතා අත්‍යවශ්‍ය බවත් පවසා සිටින ලදී. එහෙයින් වෙළෙඳ ව්‍යාපාරිකයන්ගේ බිය දුරු කර,සැලසුම් අවශ්‍ය ගොඩනැගිලි සඳහා අළුතින් සැලසුම් සකස් කර දීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින්, අඩි 50 ක ප්‍රමාණයක් ඉඩ තැබීමේ නීතිය අසාධාරණ බවත්, එලෙස ක්‍රියාත්මක වුවහොත්, ඉතිරි වන්නේ සුළු වෙලෙඳ සැල් ප්‍රමාණයක් බැවින් නගරයේ ඉදිකිරීම් සිදු කරන විට,වෙළෙඳ ව්‍යාපාරිකයන් සඳහා සහනයක් ලබාදෙන ලෙසත් ඒ සඳහා ගරු සභාපතිතුමන්ගේ මැදිහත් වීම මේ සඳහා අවශ්‍ය වන බවත් පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින්,නගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින නගරයක් වුවද ,බලංගොඩ නගර සභාව නගරයේ සංවර්ධනය ඉටුකල යුතු ප්‍රමුඛ ආයතනය වන බවත් පවසා සිටි අතර, සීමිත ඉඩ ප්‍රමාණයක තුළ කරගෙන යන ව්‍යාපාර සඳහා අනවශ්‍ය ලෙස සිදුකරන බලපෑම් නිසා ව්‍යාපාරිකයන් අසීරුතාවයට ලක් වීඇති බවත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් පැරණි ඉදිකිරීම් සම්බන්ධව ඉල්ලන තොරතුරු සම්බන්ධව විරෝධය පෑමට මෙය අවස්ථාවක් තර ගන්නා බවත් පවසා සිටින ලදී. එමෙන්ම මේ සඳහා මැදිහත් වී කිසිවෙකුට අසාධාරණයක් නොවන පරිදි ක්‍රියාකිරීමටත්, විෂය භාර අමාත්‍යවරයා දැනුවත් කර,නිසි ක්‍රමවේදයක් සකස් කර ගැනීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ17 ගල්වල පරිශ්‍රයේ වාහන සේදුම් ස්ථානයක් සකස් කිරීම**

ගල්වල පරිශ්‍රයේ ඇති අක්‍රමවත් බව වලකා එම ස්ථානයේ ඇති ගබඩා ද්‍රව්‍යය බැංකියවත්ත සභාව සතු ඉඩමක් වෙත ගෙන යාම සඳහා කටයුතු කරන බැවින් ගල්වල පරිශ්‍රයේ වාහන සේදුම් මධ්‍යස්ථානයක් සකස් කිරීම සඳහා වූ යොජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. **එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී** රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ18 බලංගොඩ නගරය පෝස්ටර්,බැනර්.කටවුට් තොර කළාපයක් බවට පත්කිරීම.**

**බලංගොඩ නගරය පෝස්ටර්,බැනර්.කටවුට් තොර කළාපයක් බවට පත්කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී** රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමන් විසින් ලංකාවේ පළමුවෙන් මෙම සංකල්පය බලංගොඩ නගර සභාව විසින් හදුන්වා දුන් අතර ප්‍රචාරණ කටයුතුවල ප්‍රවර්ධනය නිසා නැවතත් පෝස්ටර් කටවුට් වැඩි වීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන බව පවසා සිටින ලදී.ඉදිරියේදි මෙය සභාවේ තීන්දුවක් ලෙස නීතිගත කොට ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු උප සභාපතිතුමන් විසින්, උපකාරක පංති ආයතන දැනුවත් කිරීම තුළින් හා සිංහ සමාජයේ සහයෝගය මේ සඳහා ලබාගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් මේ සම්බන්ධව සභා තීරණයක් ගෙන ගැසට් කිරීම සුදුසු බව පවසා සිටි අතර,බැනර් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් ස්ථානයක් සකස් කර දින 14 ක් තුළ ඉවත්කර ගැනීමේ උපදෙස් මත ලබාදීම සුදුසු බවත් පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ02 ඇස්තමේන්තු අනුමත කිරීම**

**05:02:01 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

**05:02:01:01 සේනක පෙදෙස මාර්ගයේ අවසානයේ වාහන හරවන ස්ථානය අසළින් වැටී ඇති අතුරු මාර්ගය අඩි 04 පළලට හා අඩි 30 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීම. රු.56,000.00 ක ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීම**

සේනක පෙදෙස මාර්ගයේ අවසානයේ වාහන හරවන ස්ථානය අසළින් වැටී ඇති අතුරු මාර්ගය අඩි 04 පළලට හා අඩි 30 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වන රු.56,000.00 වන ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:02:01:02 සිටි ගාර්ඩින් මාර්ගය අවසානයේ වාහන හැරවීමට ඇති ස්ථානය අඩි 10 පළලට හා අඩි 25 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීම. රු.66,000.00 ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීම**

සිටි ගාර්ඩින් මාර්ගය අවසානයේ වාහන හැරවීමට ඇති ස්ථානය අඩි 10 පළලට හා අඩි 25 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වන රු.66,000.00 වන ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:02:01:03 ජල ටැංකිය මාර්ගයේ කරව්කැටියට වැටී ඇති මාර්ගයේ මුල සහ අග කොටස අඩි 04 පළලට හා අඩි 30 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීම. රු.53,000.00 ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීම**

ජල ටැංකිය මාර්ගයේ කරව්කැටියට වැටී ඇති මාර්ගයේ මුල සහ අග කොටස අඩි 04 පළලට හා අඩි 30 ක් දිගට කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වන රු.53,000.00 වන මුදල් ඇස්තමේන්තුවගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:02:02ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**05:02:02:01 දෙණිය කුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාරේ ඉතිරි කොටස පැති බැම්ම යොදා පාර කොන්ක්‍රීට් ඇතිරීම. රු.416,000.00 ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීම**

දෙණිය කුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාරේ ඉතිරි කොටස පැති බැම්ම යොදා පාර කොන්ක්‍රීට් ඇතිරීම සඳහා වන රු.416,000.00 ක ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:02:03 ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා**

**05:02:03:01 උඩ ඇල්ලේපොළ මාලිගාතැන්න කුෂන් කඩය ඉදිරිපිට කේ.ඩබ්.තුෂාර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම රු.279,000**

උඩ ඇල්ලේපොළ මාලිගාතැන්න කුෂන් කඩය ඉදිරිපිට කේ.ඩබ්.තුෂාර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වන රු.279,000.00 ක ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 06. මන්ත්‍රී යෝජනා

06:01 **ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය**

**06:01:01 හුනු කුඹුර කෝපිවත්ත මාර්ගයේ කාණු පද්ධතිය යථා තත්වයට පත් කිරීමට කටයුතු සලස්වා දීම**

ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රි කේ.පී.පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය හුනු කුඹුර කෝපිවත්ත මාර්ගයේ කාණු පද්ධතිය අවහිර වී ජලය ගලායාමට නොහැකි ලෙස අවහිර වී ඇති බැවින් සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටි අතර, රණවිණාවත්ත මාර්ගය ජල ව්‍යාපෘතීන් සඳහා පළුදු කිරීමෙන් අනතුරුව තවමත් යථා තත්වයට සකස් කර නොමැති අතර,එක් ස්ථානයක මාර්ගයේ කොටසක් කැඩී ගොස් ඇති පවසා සිටි අතර එම මාර්ගය සකස් කර දීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06:02 **ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා**

06:02:01 ෆලීල් හාජියාර් මාවතට පිවිසෙන මාර්ගයේ සිට වතුර ටැංකිය දක්වා අබලන් වී ඇති කොටස අළුත් වැඩියා කිරීම.

06:02:02 ගොරොක්ගහ මඩ දූනුමඩලගහ වත්ත මාර්ගය අළුත්වැඩියා කිරීම

ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි **ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින්** ෆලීල් හාජියාර් මාවතට පිවිසෙන මාර්ගයේ සිට වතුර ටැංකිය දක්වා අබලන් වී ඇති කොටස අළුත් වැඩියා කිරීම හා ගොරොක්ගහ මඩ දූනුමඩලගහ වත්ත මාර්ගය අළුත්වැඩියා කිරීමේ කටයුතු කඩිනමින් ඉටුකර දෙන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:03 **ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

06:03:01 උඩකන්ද පාර නගර සභා සීමාව තුළ සිට කාණු නඩත්තු කිරීම.

06:03:02 කරව්කැටිය පාර කාණු නඩත්තු කටයුතු කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින්, ඉදිරියට එන තද වැසිකාලය බැවින්, උඩකන්ද පාර නගර සභා සීමාව තුළ සිට කාණු නඩත්තු කිරීම හා කරව්කැටිය පාර කාණු නඩත්තු කටයුතු කිරීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී. **විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:04 **ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

06:04:01 වැවවත්ත උද්‍යානය කාණු පද්ධතියේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම

06:04:01 වැවවත්ත උද්‍යානය මාර්ග පද්ධතිය පෙර නිමි තාර යොදා අළුත්වැඩියා කිරීම.

ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්, වැවවත්ත උද්‍යානය කාණු පද්ධතියේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම හා වැවවත්ත උද්‍යානය මාර්ග පද්ධතිය පෙර නිමි තාර යොදා අළුත්වැඩියා කිරීමේ කටයුතු කඩිනමින් ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. **විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:05 **ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

06:05:01 කිරිදිගල වැලිහරනාව වට රවුම් මාර්ගයේ ප්‍රතිසංස්කරණය කිරීම.

06:05:02 කිරිදිගල අනදමෙත්ගම ශෛලතලාරාම මාවත ප්‍රතිසංස්කරණය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින්** කිරිදිගල වැලිහරනාව වට රවුම් මාර්ගයේ ප්‍රතිසංස්කරණය කිරීම හා කිරිදිගල අනදමෙත්ගම ශෛලතලාරාම මාවත ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු කඩිනමින් ඉටුකර දෙන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී. **විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:06 **ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

06:06:01 සෙලෝවත්ත මාර්ගයේ ඉතිරිකොටස තාරදමා කාණු පද්ධතිය අවසන් කර සංවර්ධනය කිරීම.

06:06:02 ජනපද පාරේ සිරිසේන මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම

06:06:03 බුද්ධ ජයන්ති පාර තාර යොදා සකස් කිරීම.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින සෙලෝවත්ත මාර්ගයේ ඉතිරිකොටස තාරදමා කාණු පද්ධතිය අවසන් කර සංවර්ධනය කිරීම, ජනපද පාරේ සිරිසේන මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම හා බුද්ධ ජයන්ති පාර තාර යොදා සකස් කිරීම යනාදි කටයුතු සිදු කිරීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමුකරන මෙහිදී ඉල්ලා සිටින ලදී.
**විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:07 **ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය**

06:07:01 බලන්ගොඩ උඩ ඇල්ලෙපොළ ,මූකලන්වත්ත පාර කාණු පද්ධතිය නඩත්තු කිරීම සඳහා වෙන්කරන ලද ඇස්තමේන්තුගත මුදල වන රු.118,000.00 මුදල ප්‍රමාණවත් නොවන හෙයින් එය නගර සභවේ සෘජු කම්කරු ශ්‍රමය යොදා ගොඩනැගීම.

06:07:02 කිරිදිගල මැද පාරේ කොහිලමුල්ල ගොඩහේන කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව කුමාරගම අනදමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය වෙත ලබාදීම.

**ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා** ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී **ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් අදහස් දක්වමින් බ**ලන්ගොඩ උඩ ඇල්ලෙපොළ ,මූකලන්වත්ත පාර කාණු පද්ධතිය නඩත්තු කිරීම සඳහා වෙන්කරන ලද ඇස්තමේන්තුගත මුදල වන රු.118,000.00 මුදල ප්‍රමාණවත් නොවන හෙයින් එය නගර සභවේ සෘජු කම්කරු ශ්‍රමය යොදා ගොඩනැගීම සිදු කරන ලෙස ඉල්ලා සිටි අතර, කිරිදිගල මැද පාරේ කොහිලමුල්ල ගොඩහේන කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව කුමාරගම අනදමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය වෙත ලබාදෙන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහතින් දක්වන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:08 ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා**

06:08:01 ඇල්ෆාවත්ත තේ කම්හල අසළ නගර සභාවට අයත් පාරේ මීටර් 30 ක් පමණ දුරට සංවර්ධනය කිරීම.

ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඇල්ෆාවත්ත තේ කම්හල අසළ නගර සභාවට අයත් පාරේ මීටර් 30 ක් පමණ දුරට සංවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර

කරන ලද අතර සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් **ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:09 ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

06:09:01 කාණු වලට ජලය බැස යා හැකි පරිදි කාණු පවිත්‍ර කර දොරවෙළ සිට අනඳමෙත්ගම ප්‍රජාශාලාව දක්වා මාර්ගය නඩත්තු කිරීම.

06:09:02 අනඳමෙත්ගම ගුණපාල මහතාගේ නිවෙස්වලට යන මාර්ගයේ ජලය රැදෙන ස්ථානය පුරවා(ප්‍රේමතිලක මහත්මයාගේ නිවස ඉදිරිපිට) මාර්ගය නඩත්තු කිරීම.

06:09:03 ශෛලතලාරාම විහාරස්ථානයට යන මාර්ගය සඳහා වීථි පහන් සවිකිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මෙම යෝජනා සඳහා ගරු සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් බලංගොඩ නගරය තුළ එක් එක් ස්ථානවල විවෘත ශීතකරණවල ගබඩා කරමින් අලෙවි කරන කුකුල් මස් කඩ සම්බන්ධයෙන් අදහස් දක්වා සිටි අතර ඔවුන් රු.1273.00 වැනි සුළු මුදලක් බලපත්‍ර ගාස්තු ලෙස සභාවට ගෙවන අතර,සභාවේ කුකුල් මස් ටෙන්ඩරය ලබාගන්නා පුද්ගලයා විසින් රු.23,000.00 වැනි විශාල මුදලක් මාසිකව සභාවට ගෙවන බව පවසා සිටින ලදී. එහිදී ඔහුට යම් අසාධාරණයක් සිදුවන බව පෙන්වා දුන් ගරු මන්ත්‍රිතුමිය විවෘත ශීතකරණවල ගබඩා කරමින් අලෙවි කරන කුකුල් මස් කඩ හිමියන්ගේ ගාස්තු වැඩි කිරීම තුළින් සභාවට ලැබෙන ආදායම ඉහළ නංවා ගත හැකි බව පෙන්වා දෙන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපති ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් පොදු වෙළෙඳ සැල තුළ වෙළෙදාම අඩු හෙයින් ඒ තුල ඇති බොහෝ වෙළෙඳ කුටි මේ වන විට වැසී ඇති බවත් සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව නගරයෙ එක් එක් ස්ථානයන්හි

විවෘත ශීතකරණවල ගබඩා කරමින් මස්,මාළු අලෙවි කල නොහැකි බැවින්,සියළු මස් කඩ පොදු වෙළෙඳ සැළ තුළට ගැනීමේ ක්‍රම වේදයක් ක්‍රියාත්මක කරන ලෙස පවසා සිටින ලදී.

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.12.26 දින /2018.01.18 පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **3,969,273.47** |
| **වෙනත් ලැබීම්** | **355,476.70** |
| **මුලු ලැබීම්** | **15,627,502.36** |
| **පුනරාවර්ථන වියදම්** | **7,872,710.77** |
| **වෙනත් වියදම්** | **1,218,163.17** |
| **මුලු වියදම්** | **15,569,995.92** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2019 -01-01 සිට 2019-01-31 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 150-0248 | 1,230.00 |
| 227-5020 | 27,055.00 |
| 227-5020 | 5,940.00 |
| 56-1906 | 5,050.00 |
| | 13,860.00 |
| BC-0005 | 10,100.00 |

| | |
|---|---|
| BC-0005 | 19,800.00 |
| CSM 0009 | 492.00 |
| DDR0008 | 505.00 |
| DDR0008 | 11,983.95 |
| GC 0001 | 4,750.00 |
| GC 0001 | 5,535.00 |
| FP 0002 | 4,200.00 |
| GK-1483 | 4,982.00 |
| GK-1483 | 9,702.00 |
| GK-6227 | 7,360.00 |
| GK-6227 | 35,360.00 |
| JD-4684 | 1,250.00 |
| JD-4684 | 1,230.00 |
| LL-2110 | 7,585.00 |
| | 5,940.00 |
| LL-7688 | 6,060.00 |
| ND-5124 | 5,055.00 |
| | 18,296.19 |
| OV/M0017 | 350.00 |
| PF-4006 | 6,930.00 |
| PF-4006 | 11,639.00 |
| QL-2901 | 2,000.00 |
| | 3,936.00 |
| RB-4786 | 20,995.00 |
| | 9,900.00 |
| RC-1107 | 14,206.00 |
| | 4,950.00 |
| RC-1118 | 13,130.00 |
| | 2,475.00 |
| VI-1833 | 1,000.00 |
| | 984.00 |
| RD-8000 | 4,950.00 |
| RC - 8183 | 22,725.00 |
| | 9,900.00 |
| RD-8240 | 6,598.00 |
| | 25,740.00 |
| MIXB-0011 | 1,845.00 |
| QR - 6976 | 2,500.00 |
| UQ - 1933 | 1,250.00 |
| | 2,583.00 |

| | |
|---|---|
| SDRR 0013 | 2,152.00 |
| 226-7521 | 18,730.00 |
| ZA - 5039 | 26,260.00 |
| ZA-5039 | 31,680.00 |
| **එකතුව** | **462,729.14** |

**09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් අදහස් දක්වමින් තමන් විසින් අය වැය යෝජනා සඳහා ඉදිරිපත් කරන ලද බොහොමයක් යෝජනා අය වැය ලේඛනයට ඇතුළත් කර නොමැති බව පවසා සිටි අතර,සභා රැස්වීම් සඳහා යෝජනා ඉදිරිපත් නොකර සිටින ලෙස එවන ලද ලිපිය පිළිබඳව දැනුවත් කිරීමක් කරන ලෙසත්,අවශ්‍ය කම්කරුවන් අවශ්‍ය ස්ථාන සඳහා නොගැනීමේ ගැටළු නිසා සංවර්ධන කාර්යයන් ඉටුකිරීමේදී ගැටළු මතුවෙන බවත් පවසා සිටින ලදී.

ග්‍රාම ශක්ති වැඩසටහන සඳහා නියමාකාරයෙන් ඇස්තමේන්තු සකස් නොකර සිටීම නිසා එහි ඉදිරි වැඩකටයුතු කරගැනීමට නොහැකි වූ බව පවසා සිටි ගරු සභාපතිතුමන්,තානායම් පිවිසුම් මාර්ගය අසළ බැම්මේ වැඩ නිමා කර බලංගොඩ තානායම නමින් නාම පුවරුවක් එහි සකස් කරන මෙන් හා තානායම් පිවිසුම් මාර්ගය සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඕළුගංතොට සියඹලාගහවත්ත පැති බැම්ම සකස් කර අවසන් කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර බලංගොඩ නගරයට ඇති එකම රෝහලේ දැඩි සත්කාර ඒකකය මේ වන විට වසා දමා ඇති හෙයින් අසරණ රෝගීන් ඉතා අසරණ තත්වයට පත්ව ඇති බවත්

මෙම රෝහල රැක ගැනීම සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත් මෙහිදී පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 3ක් න්‍යාය පත්‍රයට ඇතුලත් නොකිරීම නිසා එහි සඳහන් කර තිබූ යෝජනාවක් වන 2019 වර්ෂය සඳහා පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රු. ලක්ෂ 5 ක මුදලක් ලබාදීමේ යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් නගරය පවිත්‍රතාවය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පසුගිය දිනෙක ක්‍රියාත්මක කරන ලද බුලත් කෙළ ගැසීම වැළක්වීමේ විශේෂ වැඩසටහන පිලිබඳව සභාව දැනුවත් කර සිටි අතර,මේ සම්බන්ධව සභාව කඩිනමින් මැදිහත් විය යුතු බවත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය මන්ත්‍රීවරුන් සඳහා දුරකථන හා ඉන්ධන සඳහා වෙන්කර ඇති මුළු මුදල දීමනාවක් සේ ලබාදීමට කටයුතු කරන ලෙසත් එය වෙනත් පළාත් පාලන ආයතනවල මේ වන විටත් ක්‍රියාත්මක වෙන බවත් පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින්,නගරයේ බල්ලන් බෝ වීම සම්බන්ධයෙන් නගර සභාව සතුවද වගකීමක් පවතින හෙයින් ඒ සම්බන්ධව සභාවේ අවධානය යොමුකරන ලෙසත් , පෙහොය දින නීතියට ගරු කරමින් නගරයේ කඩ සාප්පු වසා තැබුවද සමහරක් ආයතන එය ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන බවත් ඒ සම්බන්ධව සභාවේ අවධානය යොමු විය යුතු බවත් පවසා සිටින ලදී.

පදික වෙළෙඳුන් සඳහා ඉදිකරන ලද පදික කඩ පේළිය ඉතා අසාධ්‍ය තත්වයේ පවතින බවත් ඉන් අයිනට පවතින කඩ සඳහා වෙළදාමක් නොමැති බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ලංකා බැංකුව අයින දිගේ පාරට සම්බන්ධ කිරීම තුලින් පාරිභෝගිකයන්ට ඒ කඩ සඳහා ළගාවීම  පහසු වන බව පවසා සිටින ලදී.

මහජන පොලේ ආදායම ඉහළයාම සම්බන්ධව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ක්‍රීඩාංගනය අසළ පවතින ඔප්පු නොමැති ඉඩම් කොටසෙ අයිතිය පිළිබඳව දැනුවත් වී එම ස්ථානයේ වාහන රථ ගාලක් සකස් කිරීම සුදුසු බවත් එම ඉඩම ලබාදෙන්නේ නම් වෙළෙඳ සංගමය විසින් ඉදිකිරීමක් සිදුකර නගර සභාව වෙත ගාස්තු ගෙවීමට සූදානම් බවත් පවසා සිටින ලදී.

බලංගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය පිළිබඳ කරුණු දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන්,මේ සම්බන්ධව සිංහ සමාජය මුල්වී  දැඩි සත්කාර ඒකකය සකස් කල අයුරු හා ලක්ෂ 13 ට අධික මුදලක් මහජනතාවගෙන් එකතු කර දුන් අයුරු පිළිබඳව සභාව දැනුවත් කර සිටි අතර, රෝහල් බලධාරීන්ගේ නොසැලකිල්ල හේතු කොට ගෙන දැනට අක්‍රී ය තත්වයේ පවතින දැඩි සත්කාර ඒකකය නැවත ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍යය වෛද්‍යවරයා හමුවී විසඳුමක් ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ මැදිහත් වීම ලබා දෙන ලෙස පවසා සිටින ලදී.

සමන් දේව පෙරහැරේ කටයුතු සඳහා උපකාර කර සියළු දෙනාට ස්තුති වන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා තම ඉතිරි මන්ත්‍රී ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරන ලෙසද පවසා සිටි අතර, බලංගොඩ තොග අලෙවි මධ්‍යස්ථානය පිළිබඳව කරුණු දක්වා සිටිමින් එම ස්ථානය දවස පුරා සුනඛයන්ගේ ලැගුම් හළක් බවට පත් වී ඇති බවත් එම ස්ථානයේ පළතුරු වෙළඳුන් ඇතුළු වෙළෙඳුන් සඳහා වෙළෙදාම් කිරීමට ඉඩකඩ ලබාදෙන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

බලංගොඩ නගරයේ මත්ද්‍රව්‍යය උවදුර පිළිබඳව කරුණු දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් එය මර්දනය කිරීම සඳහා තමන් විසින්ද කිහිප අවස්ථාවක සහය දක්වා ඇති නමුත් ඒ සදහා නියමිත කාර්යයන් සිදු නොවූ බව හා එලක් සිදු නොවූ බව පවසා සිටි අතර ඉදිරියේදි සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන කමිටු සඳහා සහභාගී වී සහය දක්වීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් අදහස් දක්වමින්, පදික වෙළෙඳුන් සඳහා ඉදිකරන ලද කඩ පේළිය සඳහා වෙළදාම අඩු බවත් එම වෙළෙඳ කුටි සඳහා විදුලිය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>

විෂ මත්ද්‍රව්‍යය විරෝධි යෝජනාව ඉතා යහපත් එකක් බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2019 අයවැය යෝජනා සඳහා තමන් විසින් ද එය ඉදිරිපත් කල බව පවසා සිටි අතර සෑම කොට්ඨාශයක් පාහේම එය ක්‍රියාක්මක කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

එමෙන්ම තමන් විසින් ඉහත සභාවාරයකදී යෝජනා ඉදිරිපත් කල සම්මත කරගත් පරිදි පෙර පාසල් පාලිකාවන්ගේ දීමනාව වැඩි කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2019 වර්ෂය සඳහා පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රු. ලක්ෂ 5 ක මුදලක් ලබාදෙන මෙන් මෙහිදී පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් රජය විසින් මැතිවරන පැවැත්වීමට ඇති බිය නිසා පළාත් සභා මැතිවරණයද මේ වන විට අහිමි වෙමින් යන තත්වයක් මත අමාත්‍යවරුන් හමුවිය නොහැකි නිසා පළාත් පාලන ආයතනවල බොහොමයක් කාර්යයන් පසුබෑමකට ලක්ව ඇති බව පවසා සිටි අතර, පළාත් සභා ක්‍රියාකාරීත්වය නොමැති කමින්, බලංගොඩ රෝහලේ දැඩි සත්කාර ඒකකය අක්‍රිය වීම සම්බන්ධව මිනිස් ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු වීම ඉතා ශෝචනීය බවත් පවසා සිටින ලදී.

මේ සම්බන්ධව තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ,ලංකාවේ රජයන් වෛද්‍යවරුන් බිහි කිරීමට බොහෝ මුදල් වියදම් කරන මුත් බලංගොඩ මුලික රෝහල සඳහා සිටිය යුතු අවම වෛද්‍යවරු ප්‍රමානය නොමැති වීම සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධව රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී තළතා අතුකෝරාළ මැතිනිය සතුවද වගකීමක් පවතින බව පවසා සිටින ලදී. මෙවන් අඩුපාඩු මැද මහජනතාවට අන් සරණක් නොමැති කමින් දෙවියන්ගේ පිහිට පැතීමට සිදු වී ඇති බව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් වැඩිදුරටත් පවසා සිටින ලදී.

එමෙන්ම ,බලංගොඩ කොට්ඨාශය සඳහා පවතින ලෙකුම අභිමානය වූ සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය රත්නපුර නගරයට ගෙන ගිය බැවින් බලංගොඩ මූලික රෝහල ශික්ෂණ රෝහලක් කර ගැනීමට තිබූ එකම අවස්ථාවත් අහිමි වී ගිය බව පෙන්වා දුන් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින්, රෝහලේ දැඩි සත්කාර ඒකකය සම්බන්ධ ගැටළුව විසදීම සඳහා ගරු සභාපතිතුමන් සතුවද යුතුකමක් පවතින බව පවසා සිටි අතර පක්ෂ භේදයකින් තොරව ඒ සඳහා නිරන්තර සහයෝගය ලබාදෙන බව ප වසා සිටින ලදී.
විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ආධාර මුදල් ලබාදීමේ ප්‍රමාදය පිළිබඳව කරුණු පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් අළුත් පිරිස් දක්ෂ ලෙස සභාව මෙහෙයවීම සම්බන්ධව සතුටු වන බවද මෙහිදී පවසා සිටින ලදී.

**10. අවසානය**

ගරු සභාපතිතුමන් විසින් සභාව අමතමින් , දැඩි සත්කාර ඒකකය අක්‍රිය තත්වයේ පැවතීම සම්බන්ධයෙන් සාකච්ඡා සිදුකර නැවත ක්‍රියාත්මක කරවා ගැනීමට විශාල උත්සාහයක් ගත් නමුදු එය අසාර්ථක වූ බවත් වෛද්‍ය අධිකාරියේ පවතින වරද හා සුදුස්සන්ගේ ඌනතාවය මේ සඳහා බලපෑ ඇති අතර මෙම ඒකකය නැවත ක්‍රියාත්මක කර ගැනීම සඳහා හැකි උපරිම උත්සාහය යොදවන බවත් පවසා සිටින ලදී.

සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය රත්නපුර නගරයට ගෙන යාම සම්බන්ධව තමාද කණගාටුවට පත්වන බවත්, එම කාල වකවාණුවේ කිරිදිගල පැවති ජනතා

උද්සෝෂණය වෛද්‍ය පීඨය රත්නපුර නගරයට ගෙන යාම සම්බන්ධව එක් හේතුවක් වූ බවත් පවසා සිටින ලදී.

2018 වර්ෂයේ පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබාදුන් ලක්ෂ 4 මුදල බොහොමයක් මන්ත්‍රීවරුන් වැඩදායි ලෙස යෙදවූ නමුදු යම් සිද්ධි කිහිපයක් නිසා මේවන විට විගණන ගැටළු මතු වී ඇති බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් 2019 වර්ෂය තුළ කොට්ඨාශ 10 තුල පවතින්නා වූ කාණු පද්ධතීන් සියල්ල සකස් කිරීමට අපේක්ෂා කරන හෙයින් ඊට සම්බන්ධ යෝජනා ලබාදෙන ලෙස පවසා සිටි ගරු සභාපතිතුමන් විසින්, පසුගිය යෝජනා අවසන් වූ විගස නඩත්තු යෝජනා සමඟ සියළු සංවර්ධන යෝජනා ලබා ගන්නා බව පවසා සිටි අතර මේ සම්බන්ධව වැරදි අවබෝධ ඇති කර නොගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙදින සභාවේ වැඩ කටයුතු සාර්ථකව සිදු කර ගැනීමට සහය දක්වූ සියළු දෙනාට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු සභාපතිතුමන් විසින් ප.ව.3.30 ට පමණ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමළසේන,

සභාපති,

බලංගොඩ නගර සභාව.